ශ්‍රී ලංකාවේ පැරණි සිංහල රහස් භාෂා

Ancient Mysterious Languages in Sri Lanka

ආරිය ලගමුව

Abstract

The linguists, archaeologists and other scholars have varied opinions and some claim that art of writing was of local origin and yet others say that it was of foreign. With regard to the time- span of origin of the Sinhala alphabet and the art of writing, the prevailing conclusions also vogue and evasive. It is believed that a set of characters and an art & writing were transferred from ancient India to Sri Lanka, which paved the way to the emergence of Sinhala alphabet and language. In any language, there is some sort of duality, spoken and written. It is of common acceptance among scholars that in any society, the oral form of the language first came into being and along the passage of time, evolved the written tradition. However, it is clear that the ancient indigenous ancestors of Sinhalese, Yaksha, Naga and Deva (tribes of Demon, cobra and God) had used some kind of tribal languages for expressing their opinions to the others, before the writing system came to light. But these dialectic elements are mystery languages for us at the present. At the same time, some of the secret languages were intentionally introduced to the society by various individuals and groups, after came to vogue the Sinhala alphabet (writing) and language. This happened because they handled and practiced some of the fields of discipline, such as indigenous medicine, astrology, incantation, rituals , black magic etc. The reason for this system was to preserve, propagate, correct practice and also avoid of negative consequences to the society. Because, the above disciplines or

some part of them were very important, valuable, secretive and sacred. The mystery languages prepared as formulas by words, letters and numerals of the common languages and mathematics.

The problem is what are the historical mysterious languages of Sinhalese and how they use them in the society. Objective of the article is to discover and how when why and how the mysterious language tradition in the early period had come to be written and spoken in Sri Lanka. It is clear that there were mysterious languages in some fields of discipline and used them for the benefits of the Society.

Keywords: Alphabet, Formula, Language, Letter, Numerals, Mysterious

හැඳින්වීම

පැරණි ලංකාද්වීපයේ විසුවේයැයි සැලකෙන යක්ෂ, නාග, දේව හා සුපර්ණක යන ගෝත්‍රික මානවයන් විසින් සිය අදහස් හුවමාරු කරගැනීම සඳහා භාවිත කරන ලද නිශ්චිත අක්ෂර හෝඩියක් හෝ ලේඛන කලාවක් නොපැවැති භාෂාවල වචන ඛණ්ඩ හෝ වාගාලාප පිළිබඳ ව විද්වතුන් විසින් විවිධ අදහස් පළ කර තිබේ. එහෙත් එම භාෂා මළ හා ගූඪ භාෂා ගණයට නූතන යුගයේ පත් වී තිබේ. අවම වශයෙන් ක්‍රි.පූ.3 වෙනි සියවසේ සිටම බ්‍රාහ්මී අක්ෂරමාලාව හා සිංහල ප්‍රාකෘත භාෂාව නූතන සිංහල අක්ෂර හා භාෂාව දක්වා විකාශනය වූ වකවානුවෙන් අනතුරුව සිංහල අක්ෂර හෝඩිය හා භාෂාව සමගම අංක ක්‍රමය ශ්‍රී ලාංකේය සමාජයේ පුළුල්ව භාවිත කිරීම තුළින් පෞද්ගලික හෝ පොදු සමාජයට අනාවරණය නොවිය යුතුයැයි සළකන ලද විවිධ විෂය ක්ෂේත්‍රයන්, විශේෂයෙන් යන්ත්‍ර, මන්ත්‍ර, බලිතොවිල්, දේවකාර්යයන්, ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය, දේශීය වෛද්‍ය විද්‍යාව යනාදි ක්ෂේත්‍ර වල දී සිංහල රහස් භාෂා ක්‍රම භාවිත කර තිබේ. මේ ගූඪ භාෂා රටාවන් පැරණි යුගයේ පමණක් නොව නූතන මෙන්ම අනාගතයේදී ද වැදගත් වනු ඇත.

අරමුණ

උක්ත විවිධ පැරණි සිංහල රහස් භාෂා ක්‍රම ගවේෂණය කිරීම මගින් ඒවා විග්‍රහ කර විවරණය කිරීමත්, භාෂා-සාහිත්‍යය, පුරාවිද්‍යාව, උරුම කළමනාකරණය, ඉතිහාසය, ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය, දේශීය හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, හෝමියෝපති වෛද්‍ය විද්‍යාව ඇතුළු විෂය ක්ෂේත්‍රයයන් හදාරණ හා විද්‍යාර්ථීන්ටත්, පර්යේෂණයන්ටත් දැනුම හා අවබෝධය ලබාදීමත්, අභාවිතය නිසා අභාවයට ගොස් තිබෙන එම දැනුම අනාගත පරම්පරාවලට සම්ප්‍රේෂණය වීම පිණිස සංරක්ෂණය කර තැබීමත් මුඛ්‍ය අරමුණ ය.

කාලසීමාව

සිංහල රහස්‍ය භාෂාවන් පිළිබඳ ප්‍රධාන වශයෙන් වර්තමානය වනවිට සත්‍ය හා නිවැරදි සාක්ෂ්‍ය, සාධක හා දත්ත අනාවරණය කරගත හැකිවන්නේ ලිඛිත සාධක මගිනි. ඒ අනුව ක්‍රි.ව. 1 වෙනි සියවසේ සිට අභිලේඛන සහ ක්‍රි.ව. 13 වෙනි සියවසේ සිට පැවතෙන පුස්කොළ ලේඛනත් ඇති හෙයින් ක්‍රි.ව. 1 සියවසේ සිට ක්‍රි.ව. 18 වෙනි සියවස දක්වා කාලයට මෙම ගවේෂණය සීමා කරනු ලැබේ.

ක්‍රමවේදය

මෙම විමර්ශනයෙහිලා ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත වන්නේ ලේඛන ගවේෂණය යි. මූලික වශයෙන් ක්‍රි.ව. 1 වෙනි සියවසේ සිට ක්‍රි.ව. 18 වෙනි සියවස දක්වා ශිලා ලේඛන අධ්‍යයනය කරන ලදි. එසේම ක්‍රි.ව. 13 වෙනි සියවසේ සිට ක්‍රි.ව. 18 සියවස දක්වා රචිත පුස්කොළ පොත් හා පුස්කොළ ලේඛන ද පැරණි මුද්‍රිත ශිල්ප ශාස්ත්‍ර පොත් ඇතුළු සාහිත්‍ය ග්‍රන්ථ හා ලිපි ලේඛන ද පරිශීලනය කරනු ලැබිණි. මේ වන විට ජ්‍යෝතිෂ් ශාස්ත්‍රය, දේශීය හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ ගුඪ ශාස්ත්‍ර කටයුතුවල නියලෙන ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන් සමග සම්මුඛ සාකච්ඡාවල නිරත වූ අතර ප්‍රාසාංගික කලා නිර්මාණ නිරීක්ෂණය කරමින් ක්ෂේත්‍ර ගවේෂණයක් සිදුකරන ලදි.

විමර්ශණය

"භාෂාව" අදහස් සන්නිවේදනය කිරීමෙහිලා ප්‍රධාන මෙන්ම ප්‍රබල තම මාධ්‍යය යි. සමාජ ජීවයකු වශයෙන් මිනිසා සතු භාෂාමය ශක්‍යතාව සෙසු සත්වයන්ට නොමැති විශිෂ්ටතම හැකියාවය. ආදිතම ශෛල යෞගික මානවයා සිය අදහස් ප්‍රකාශ කිරීම පිණිස මුලින්ම විවිධ ශබ්ද, ශාරීරික අභිනය, භෞතික වස්තු හා සිතුවම් සංකේත භාවිත කළේය. අනතුරුව ශබ්ද, වචන ලෙස උච්චාරණය කරමින් භාෂා කථනයට හුරු වූයේය. තවත් දීර්ඝ කාලයක් ඇවෑමෙන් සංකේත, සිතුවම් ආදිය චිත්‍රාක්ෂර ලෙස නිරූපණය කරමින් ඒ තුළින් අක්ෂර හා ලේඛන කලාව නිපදවා ගත් බවට පුරාවිද්‍යාත්මක සාධක තිබේ. ඒ අනුව භාෂාවේ කථා ව්‍යවහාරය හා ලේඛන ව්‍යවහාරය යන ද්විරූපතාව ඇති විය. යම් සමාජ සංස්කෘතියක කථාව්‍යවහාර භාෂාව උපරිම වර්ධනයට පත් වූ පසු ලේඛන ව්‍යවහාරය ආරම්භ වෙයි. ඒ අනුව යම් ජාතියක හෝ සමාජයක ශිෂ්ටාචාරය ප්‍රභවය වීමේ ප්‍රධාන ලක්ෂණ අතර භාෂාව, අක්ෂර, ලේඛන කලාව ප්‍රධාන සාධකයන් බව ගොර්ඩන් චයිල්ඩ් විග්‍රහ කළේය. 'භාෂාව සංස්කෘතියේ වාහකයා' ලෙස ඩොනල්ඩ් එෆ් ලැක් සලකන අතර සැමුවෙල් ජොන්සන් පවසන්නේ 'ජාතියක පෙළපත භාෂාව' බවයි. මුනිදාස කුමාරතුංග "ජාතියක අයුෂ නම් ඒ ජාතියේ භාෂාව"යි නිගමනය කළේය (මුනිදාසත1983ථ48).

නූතන ලෝකයේ භාෂා පොකුරු අතරින් පැරණිතම වන්නේ "ඉන්දු - යුරෝපීය" භාෂා පොකුර ය. එය මුල භාෂාවකින් (Proto-Indo European Language) ආරම්භ වූ බව ඞිගස්ට් ස්ලෙයිචර් සඳහන් කරනු ලැබේ ඃජයකැසජයැරත1861ථ84*ග මෙම ඉන්දු -යුරෝපීය භාෂා පොකුරු නැවැත උපභාෂා පොකුරු, දෙකකට බෙදුණි.

I. ඉන්දු ආර්ය භාෂා පොකුර (සිංහල, පාලි, සංස්කෘත)

II. යුරෝපීය භාෂා පොකුර (ප්‍රංශ, ලතින්, ග්‍රීක්, පර්සියන්)

ඉන්දු ආර්ය භාෂා ත්‍රිත්වයෙන් සිංහල භාෂාව ක්‍රි.පූ. 1500 දී පමණ උත්තර භාරතීය වේද භාෂාවෙන් පරිණාමයට පත් වී ප්‍රභවය වූවක් බවත් සංස්කෘත හා පාලි යන භාෂාද්වයයටම වඩා එය පැරණි බවත් මුනිදාස කුමාරතුංග පැහැදිලි කළේය (එම:53). ප්රාන්ස් බොප්ස්

සහ ඕගස්ට් සිලේවර් යන වාග් විද්‍යාඥයන්ගේ මතය වන්නේ සිංහල ක්‍රි.පූ. 4000 දී පමණ උත්තර භාරතයේ බිහි වූ බවයි (ibid:86). හර්මාන් ග්‍රාස්මාන් සිංහලය අවම වශයෙන් වර්ෂ 3500ක් වත් පැරණි බව පැවසීය. (Grassmann;1940:93) සිංහල භාෂාවේ පෞරාණිකත්වය නිසාම අභ්‍යාවකාශ පණිවුඩ සම්ප්‍රේක්ෂණය කිරීම පිණිස 'හෙළබස' (සිංහල) ඇමරිකානු අභ්‍යාවකාශ විද්‍යාඥයන් විසින් තෝරාගත් බව එස්. ජී. එම්. වීරසිංහ පෙන්වා දුන්නේය (සේනානායකත2012,70). උක්ත කරුණු අනුව ක්‍රි.පූ. 4000 (මීට වර්ෂ 6000 පෙර) බෝප්ස් හා ස්ලේවර්ගේ දින නිර්ණය නොසලකා හැරියත් ග්‍රාස්මාන් හා විශේෂයෙන් කුමාරතුංග මතය අනුව සිංහල භාෂාව ක්‍රි.පූ. 1500 (වර්ෂ 3000 පෙර) සම්භවය වූ බව අනුමාන කළ හැකිය. එපමණක් ද නොව සිංහල ජාතියට ද වඩා සිංහල භාෂාව පැරණි බවත් දකුණු අසියාවේ විශිෂ්ටතම භාෂාව එය බවත් පැහැදිළිය. (සේනානායකත2012,71)

නූතන ඉංග්‍රීසි භාෂාව ඉතා මෑත යුගයේ යුරෝපීය භාෂා පොකුරකින් බිහි වුවක් බැවින් ඓතිහාසිකව එම වර්ගයේ මුල් භාෂාවලට අයත් නොවන්නකි. එමසන්ට් ටෙනන්ට් පවසන පරිදි ඉංග්‍රීසි, තනි භාෂාවක් නොව ලතින්-ඇන්ග්ලෝ සැක්ෂන් හා ප්‍රංශ භාෂාවල සංයෝගයකි. යටත්විජිත සංකල්පය තුළ එය භාවිතය අතින් නම් ඉදිරියෙන් තිබේ. එහෙත් චීන භාෂා භාවිතය අනුව ඉංග්‍රීසි දෙවනස්ථානය ගනියි. ලෝක භාෂාවක් වශයෙන් ඉංග්‍රීසි උගත යුතු ලොව පැතුරුණ බසකි.

සිංහල භාෂාවේ ප්‍රභවය පිළිබඳ විග්‍රහ කරන කුමාරතුංග ශුද්ධ සිංහල භාෂාව හෙළ භාෂාවේ පරිණාමයක් බවත් සිංහල භාෂාවට සංස්කෘත හා පාලි භාෂාවල සම්මිශ්‍රණයක් නොවන බවත් පෙන්වා දුන්නේය (මුනිදාසත1945,10). වර්තමාන සිංහල භාෂාවේ වචන කෝෂය එම අර්ථයෙන් ඒ අයුරින්ම භාවිත වෙයි. සිංහල භාෂාවේ "ල" කාරයෙන් ලය හෙවත් හදවත අර්ථ ගැන්වෙයි. එය පැරණි යුගයේ සිට (කථන) භාෂණයේදිත් ලේඛනයේදිත් භාවිත විය. නිදසුනක් වශයෙන් සීගිරි ගීවල "ල" අක්ෂරය "ල කොල් හෙළඹුන්" යන යෙදුම්වල යෙදී තිබේ. මෙයින් අදහස් වන්නේ හදවත කළඹන පැහැපත් යුවතියන් යන්න යි. වර්තමාන සිංහල භාෂාවේ ද මීට ශතවර්ෂ 10-12 කට ඉහතදී යෙදුන එම වචනය ඒ අයුරින්

ම ව්‍යවහාර වෙයි. එනම් ළය, ළ තෙත්, ළමැද, ලගන්නා, ලගමුව (හදවත වැනි, ක්‍රේන්ද්‍රිය ගම / ලගන්නා සුළු ගම්මානය) යනාදි වචනවල මෙනි. සමහර වචන වලට නූතන මිශ්‍ර සිංහල භාෂාවේ ද විකල්ප වචනයක් පවා නොමැත. ඉතා ප්‍රකට හෙළ බසෙහි වචනයක් වූ 'දොලදුක' යනු 'දෙහදක දුක' නොහොත් හදවත් දෙකක (මවගේ හා දරුවාගේ) ආශාව යන අදහසය. සංස්කෘත භාෂාවේ ගැබිණිය හැඳින්වෙන්නේ 'ද්විහර්දයන්' නමිනි. එහෙයින් දොලදුක යන්නෙන් 'ගැබිණියගේ කැමැත්ත' අදහස් වීම අර්ථාවන්විත ය. අම්මා - යනු 'අක්-මැව්' හෙවත් අග්‍ර මවන්නී යන්නයි. (සං, අග්‍රමාතෘ, පා, අග්ග මාතා) මේ ලෝකයේ මවන්නන් අතර උසස්ම මවන්නිය 'අම්මා' ය. තවත් මහාබ්‍රහ්ම, විශ්වකර්ම, දෙවියන් වහන්සේ, ශිව වැනි මවන්නෝ සිටිතැයි කියතත් දරුවාව භෞතිකව මවන්නේ මවක් පමණි. අම්මා විසින් සෙස්සන් පමණක් නොව තමන් ද මවා ගන්නීය. එනම් අම්මා විසින් ම තවත් අම්මා කෙනෙකු බිහි කළ යුතුය. මේ කරුණු නිසා අම්මා ලෝකයේ අග්‍රතම මවන්නිය වන්නීය. (එම,72) මෙලෙස වත්මන් සිංහල බසේ හෙළ බස නොනැසී පවත්වන බව පැහැදිලි ය. සිංහල භාෂාවට සංකෘත, පාලි, ද්‍රවිඩ (Rasanayagam;1984:78). පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි වචන පසු කාලයේ දී සංකළනය වී මිශ්‍ර සිංහල භාෂාව පරිණාමය වී ඇත. ප්‍රථමයෙන් සංස්කෘත ආභාෂය ලැබුණු අතර ඉංග්‍රීසි තවමත් සංකලනය වෙමින් තිබේ. එසේ වුව ද සිංහල භාෂාවේ පෞරාණිකත්වය, අර්ථපූර්ණත්වය, උපයෝගිතාව, ලයාන්විත භාවය, නම්‍යශීලි ස්වභාවය යනාදිය මැනවින් අවබෝධ කර ගැනීම එහි පෞඪත්වය වටහා ගැනීමට ඉවහල් විය.

සිංහල භාෂාව පිළිබඳ රොබර්ට් නොක්ස් සිය ග්‍රන්ථයේ " මොවුන්ගේ භාෂාව වූ කලී වාග් ශක්තියෙන් පොහොසත් වූ ලාලිත්‍යයෙන් යුක්ත වූ මට සිලිටි වූ, එය කථා කරන මනුෂ්‍ය වර්ගයා මෙන්ම ශිෂ්ට වූ ශ්‍රේෂ්ඨ භාෂාවකි" යනුවෙන් ප්‍රකාශ කර ඇත (Knox;1958:82).

භාෂාව පරිණාමය වෙමින් වෙනස් වන්නකි. එහි දී සමහර භාෂාවන් හෝ ඒවායේ අංග අභාවයට යන්නටත්, එකතු වන්නටත් පුළුවන. සමහර විට එවැනි කොටස් පමණක් නොව භාෂාවක් ම මුළුමනින්ම භාවිතයෙන් ගිලිහී යන්නට පුළුවන. සමහර භාෂාවන්

තත්කාලයේ භාවිත වෙයි. මේ නිසා භාෂාව සජීව භාෂා හා අජීව හෙවත් මළ භාෂා ලෙස වර්ග වෙයි. නූතන යුගයේ සංස්කෘත, පාලි වැනි භාෂාවන් මළ භාෂා ලෙස සැලකේ. මළ බසක් සමකාලීනව පොදුවේ සමාජයේ ප්‍රායෝගිකව භාවිත නොවන නමුදු යම් යම් අවශ්‍යතාවන් සඳහා හෝ වටිනාකම් මත අධ්‍යයනය කරනු ලැබේ. එවැනි භාෂාවන් අතීතයට අයත් වනවා වුවත් ඒ භාෂාවෙන් අනර්ඝ දැනුම් සම්භාරයක් ගබඩා කර තිබෙන්නට පුළුවන. සංස්කෘත හා පාලි භාෂාවන් එබඳු භාෂාද්වයයකි. ලංකාවේ ව්‍යාප්ත වූ එ වැනිම රහස්‍ය භාෂා හෝ උපභාෂා ද තිබේ. එබඳු භාෂා අර්ථකථනය කර ගැනීමෙන් වර්තමානයට හා අනාගතයටත් මහත් ඵල ප්‍රයෝජන ලබා ගන්නට හැකියාව තිබේ. එවැනි රහසිගත උපභාෂා ජනසමාජයේ ඉබේ නිර්මාණය නොවන අතර කිසියම් හේතූන්, අවශ්‍යතාවන් හා අගයන් මත මිනිසා විසින් සකස් කර ගනු ලැබේ. සිංහල භාෂාවේ ද පැරණි යුගයේ භාවිත කළ රහස් භාෂාවන් කිහිපයක් තිබුණි. ශිලා ලේඛන, පුස්කොළ පොත්, අත්ලිපි හා පුරාණ ග්‍රන්ථ යන මූලාශ්‍රයවල මෙන්ම ජන කණ්ඩායම් වල භාෂා ව්‍යවහාරයේ ද එවැනි රහස්‍ය භාෂා හා භාෂා පිළිබඳව සඳහන් වෙයි.

ආදිතම යුගයේ සිට සමාජයේ මනුෂ්‍ය වර්ගයා සිය අදහස් අන්‍යයන්ට ඒත්තු ගැන්වීම පිණිස විවිධ උපක්‍රම හා විධික්‍රම භාවිත කළේය (ලගමුව;1992:14). ඒ අතරින් ප්‍රධානත්වය හිමිවන්නේ භාෂාවට ය. විජයගමනයට (මව;1912:19) පෙර ප්‍රාග් ඓතිහාසික යුගයේ ලක්දිව විසූ යක්ෂ, රාක්ෂ, නාග, සුපර්ණක වැනි ගෝත්‍රික ජන කණ්ඩායම් ඔවුනොවුන් අතර අදහස් හුවමාරුකර ගන්නා ලද්දේ ඔවුන්ටම ආවේණික ප්‍රාථමික භාෂාවලින් බව මූලාශ්‍රය වල සඳහන් වෙයි. (හිලරිස්ත1956,34) පැරණි ග්‍රන්ථයක් වූ සරස්වතී බණ්ඨාභාරණ නම් කෘතියේ හඳුනා නොගත් භාෂාවකින් රචිත ශ්ලෝක හා වගන්ති අන්තරගත වෙයි. නිද.

'පණමත පණ අප්ප කුජිත"
ගොලීචලණග්ග ලග්ග පඬිවිංවම්
දස සුණහ දප්පණේසු
එ ආ සතනු දලං ලුද්දම්'

වැනි ශ්ලෝක යක්ෂ භාෂාවෙන් රචිත බව විද්වතුන්ගේ මතය වේ (Saraswati;1937:65). එහෙත් අර්ථ ගැන්වීමට නොහැකි ඒවා රහස් භාෂාව කට සමානය. එසේම ධර්මප්‍රදීපකාවේ ද මෙවැනි වගන්ති තිබේ. "දයිමාළේ ඉන්සේ දා පුදායි මාළේ" යන වගන්තිය එබන්දකි. මේවා නාග භාෂාවට අයත් වන බව සමහරුන් කියනු ලැබේ. මෙවැනි ගූඪාර්ථ සහිත වාක්‍ය කුමන මූල භාෂාවකින් නිපන්නේ දැයි අවිනිශ්චිත වන අතර, සමහර දෙනාගේ අදහස ද්‍රවිඩ භාෂාවෙන් පැමිණි බවයි. එහෙත් භාෂා විශාරදයන්ගේ මතය වන්නේ මේවා හෙළ බසට අයත් වන බව වේ. මෙවැනි භාෂාවලින් ග්‍රන්ථ මූලාශ්‍රය වල සඳහන් වන පරිදි පුස්කොළ පොත්පත් ද රචනා කර තිබේ (Mirando;1984:5). ක්‍රි.පූ. 8 වෙනි ශත වර්ෂයේ විසුවේයැයි සැලකෙන ලක්දිව රාවණා රජු විචක්ෂණ ප්‍රාඥයකු වූ බවත් ඔහුගේ ඥානය මහා විශාරදයන් දස දෙනෙකුගේ හිස් වලට සමාන බවත් එනිසා 'දසිස්'නමින් ඔහු හඳුන්වන බවත් පැවැසේ (Senaviratne:1984:51). එසේම ත්‍රිලිංග භාෂා විශාරදයකු වූ හෙයින් 'ත්‍රිලිංග භාෂාචාර්ය' යන අපර නාමයෙන් ඔහු හඳුන්වා ඇත (උත්තරානන්ද;1956:32).

සුළු රාජාවලියේ සඳහන් වන්නේ රාවණා රජුගේ භාෂාව තෙළිඟු භාෂාව බව ය (සුරා;1926:64). එහෙත් එම කරුණ විවාදාපන්න එකකි (Senaviratne:1984:52). රාවණා රජු විසින් කුමාරතන්ත්‍ර, අර්ක ප්‍රකාශ, නාඩි ප්‍රකාශ, උඩිස්තන්ත්‍ර හා ශිවතණ්ඩව ස්තෝත්‍ර යන කෘතීන් රචනා කරන ලද බව ද සඳහන් වෙයි (ගුණවර්ධන;1984:36). දේශීය වෛද්‍ය විද්‍යාව හා යන්ත්‍ර මන්ත්‍ර පිළිබඳව අන්තර්ගත වන මේ පොත් දේශීය ජනතාව සඳහා රචනා වූ බැවින් සිය බස මිස වෙනත් බසක් ඒ සඳහා භාවිත කළ බව සිතිය නොහැකිය (උත්තරානන්ද;38, 1956). මෙම කෘතීන් රචිත තත් භාෂාව ගූඪාර්ථවත් රහස් භාෂා ලෙස අනුමාන කළ හැකිය.

ජන සමාජයේ පැරණි යුගයේ සිට ම පුද්ගල හැඟීම්, දැනීම් හා අදහස් ප්‍රකාශනය පිණිස අක්ෂර හෝ වචන භාවිත නොවන භාෂාත්මක විධික්‍රම යොදාගෙන තිබේ. ඒවා කායික භාෂා සහ ලාක්ෂණික භාෂා ලෙස හැඳින්වේ (පෙරේරා;1935:72). කායික භාෂා යනු ඇස්, කන්, නාස, මුහුණ, අත්, පා, ඇඟිලි යනාදි ශාරීරික අවයව භාවිත කරමින් ශබ්ද, වචන, ලේඛන ආදිය භාවිත නොකර අදහස්

ප්‍රකාශ කිරීම ය. ලාක්ෂණික භාෂා වලදී භාවිත වන්නේ සලකුණ, සංකේත හා විවිධ භෞතික වස්තූන් ය. රසුවංශයෙහි මෙම භාෂා භාවිත කළ බවට තොරතුරු තිබේ. මද්දණ්ඩාචාර්යයන් විසින් ද ඒවා භාවිත කර ඇත (රසුවංශ;1961:32). කායික භාෂා, කායික මුද්‍රා, හස්ත්‍ර මුද්‍රා, හා භූත මුද්‍රා යන වර්ගතුනට බෙදෙයි. කායික මුද්‍රා භාෂාව යනු ශාරීරික අංග චලනය, සංකේත, හා අභිනය ක්‍රම මඟින් ප්‍රකාශනයක් කිරීමය. හස්ත්‍ර මුද්‍රා භාෂාව ක්‍රම තුනකට යොදා ගැනේ. අත් හා ඇඟිලි චලනය කිරිමෙන් යමක් සන්නිවේදනය කිරීම එකකි. ශරිරයේ එක් එක් ස්ථානවල ට අකුරු ගලපා ඒ ඒ තැන් ඇඟිලිවලින් ස්පර්ෂ කිරීම දෙවැන්නයි. මෙම ක්‍රමය අඳ, ගොළු, බිහිරි පුද්ගලයන් විසින් ප්‍රධාන වශයෙන් භාවිත කරණු ලැබේ. එබැවින් ඒ ඒ පුද්ගලයන්ට අනුව 'අන්ධ භාෂාව' 'මුග භාෂාව' හා 'බධිර භාෂාව' ලෙස හඳුන්වනු ලැබේ. අනෙක් කායික භාෂාව 'භූත මුද්‍රා භාෂාව' ය. එනම් අත් ඇඟිලිවලින් අක්ෂර නිපදවා ඇඟිලි වල ඒ ඒ ස්ථාන ස්පර්ෂ කිරීමෙන් වචන ගලපා අදහස් ප්‍රකාශ කිරීමය. මෙලෙස කායික විධික්‍රම භාවිත කරමින් අංග චලනය, මුද්‍රා ක්‍රම, සංකේත හා අභිනය ක්‍රම භාවිතය යන ක්‍රියාකාරකම් වලින් පමණක් යම් අදහසක් සන්නිවේදනය කරන බැවින් මේවා 'කායික භාෂා' ලෙස හැඳින්වෙයි. එම ක්‍රම එවා ප්‍රගුණ කළවුන්ට පමණක් සීමා වන හෙයින් කායික භාෂා එක්තරා ආකාරයට 'කායික රහස් භාෂා' ලෙස හැඳින්විය හැකිය.

යම් රටක ප්‍රධාන ජාතිය සතු භාෂාව ප්‍රධාන භාෂාව වේ. වර්තමානයේ එය ජාතික භාෂාව හෝ රාජ්‍ය භාෂාව යන නමින් ද හැඳින් වෙයි. ප්‍රධාන භාෂාව භාවිත කරන ජනතාව අතර කුඩා කණ්ඩායම් අතර හා ප්‍රාදේශීය වෙනස්කම් තිබේ. ඒවා උපභාෂා නම් වේ. වෙනත් කුඩා ජන කණ්ඩායමක් එවැනි රටක වෙසෙන්නේ නම් ඔවුන් සතු භාෂාවන් ද උපභාෂා ගණයට ගනු ලැබේ (ධර්මදාස;1972:76).

සමාජයේ විවිධ කරුණු පදනම් කරගෙන උපභාෂා ඇතිවිය හැකිය. ඒ අනුව පළාත්, ප්‍රදේශ, ජාති, වර්ග, පංති, කුළ, වෘත්තීන්, සමාජ තරාතිරම්, වයස, කණ්ඩායම්, සංස්කෘතීන්, උගත් - නූගත්කම් යනාදි වශයෙන් සැකසුණු උපභාෂා සමාජයේ භාවිත වේ. උපභාෂා බොහෝ දුරට භාවිත වන්නේ කථා ව්‍යාවහරය තුළය. ලේඛන ව්‍යවහාරයේ උපභාෂා භාවිත වන්නේ ඒ ඒ ලේඛන වර්ගය හා එය භාවිත වන

අවස්ථාවන් අනුවය. මෙවැනි උපභාෂා කිසියම් රහස්‍ය භාෂා ලෙස සැලකිය හැකිය. පුරාතන අවදියේ සිට සිංහල භාෂාවේ උපභාෂා පැවැති බව පැහැදිලි ය. යක්ෂ භාෂාව, රාක්ෂ භාෂාව, නාග භාෂාව, ව්‍යාධ (වැදි) භාෂාව, රොඩී භාෂාව, රාජක භාෂාව, (උඩරට රදළවරුන්ගේ) උඩරට භාෂාව, පහතරට භාෂාව, කුමාර භාෂාව, (ළදරුවන්ගේ) පතාල භාෂාව (මැරයන්ගේ) භික්ෂු භාෂාව, කෞරව භාෂාව (එනම් කුළයේ) හස්ති භාෂාව, කාක භාෂාව, ප්‍රේත භාෂාව යනා දි උපභාෂා ප්‍රභේද රාශියක් තිබේ (වීදාගම;1985:22). මෙවැනි සමහර උපභාෂා භාෂණයට පමණක් නොව ලේඛණයට ද යෙදිණි. යක්ෂ භාෂාව හෙවත් යකදුරු භාෂාව, බලිතොවිල්, හදි හුනියම්, යන්ත්‍ර, මන්ත්‍ර යාදිනී, ප්‍රලය වීම වැනි දෑ සඳහා වාචිකව ද යන්ත්‍ර, ලේඛන සඳහා ලිඛිතව ද යොදා ගන්නා ලදි. මෙවැනි භාෂා එකී කණ්ඩායම් අතර පමණක් හෝ වෘත්තිකයන් අතර පමණක් භාවිත වන අතර අන්‍යයන්ට වටහා ගැනීමට අසීරුය. එහෙයින් මේවා පුරාණයේ සිට පරම්පරාගතව පැවැත එන රහස්‍ය භාෂා ලෙස සැලකීම වරදක් නොවේ.

පැරණි යුගයේ සිට රචිත ලිපි ලේඛන විශේෂයෙන් ම ශිලා ලේඛන, පුස්කොළ ලේඛන හා පුරාණ ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් මේ වන විටත් මෙරට ශේෂව තිබෙන අතර එයින් සමහර ලේඛන රහස් භාෂා වලින් ලියා තිබෙන හෙයින් තේරුම් ගැනීමට දුෂ්කර වී තිබේ. සමහර පුස්කොළ පොත් වල අන්තර්ගතය පමණක් නොව ග්‍රන්ථ නාමය පාවා ගුප්ත ලෙස දක්වා තිබේ. මහනුවරල රත්නපුරල මාතරල හම්බන්තොට වැනි පළාත් වලින් සොයාගන්නා ලද ක්‍රි.ව. 16-17 සියවස් වලට අයත් ආයුර්වේද වෛද්‍ය විද්‍යා පොත් කිහිපයක් රහස්‍ය ලෙස නාමකරණය කර තිබෙන්නේ මෙලෙසිනි (මහින්දසිරි;1956;88).

ග්‍රන්ථ නාමය	අන්තර්ගත විෂය ක්ෂේත්‍රය
'කුඹුලු කඩුප්පුවා'	සර්ප විෂ වෙද පොත
'වෙදරාළගෙ මෝ'	කැඩුම්-බිඳුම් වෙද පොත
'සමසක් පිපෙන මල්'	මාලේ (ප්‍රදර) අතිසාර වෙදපොත
'භූමි අවතාර'	ජලභීතිකාව වෙද පොත

'පටබැඳි ආරච්චිල. සෙංගමාල (කාමිලා) වෙදපොත

(ගල්ලෙන්ගොල්ල පු.වි.පු.පො.එ. උඩුනුවර)

මෙම පොත්වල ඇතුළත් වන්නේ උක්ත රෝගල රෝග ලක්‍ෂණ, ඊට ප්‍රතිකාර ක්‍රම හා අදාළ ඖෂධ වර්ග යනාදිය පිළිබඳවය.

විවිධ අප්‍රකට රහස් භාෂාවලින් පැරණි යුගයේ සිට පුස්කොළ පොත් හා වෙනත් ලේඛන රචනා කර තිබෙන අතර එහි විශේෂත්වය නම් එම ලේඛන රචනා කළ හෝ එම භාෂා ක්‍රම පිළිබඳව ප්‍රවීණයන්ට හැර සෙසු කුමන භාෂා විශාරදයකුට වුවද තේරුම්ගැනීම අපහසුය. එම භාෂාවන් ප්‍රගුණ කළ හැකිවූයේ ද මෙම ක්ෂේත්‍රයේ නියැලුන කිහිපදෙනෙකුට පමණි. එහෙයින් ඒවා වටිනා රහස් ගුරු මුෂ්ටියක් ලෙස පැවතී ඇත. එවැනි ගුප්ත භාෂාවලින් ලියන ලද කෘතින් අතර වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ දේශීය ආයුර්වේද වෛද්‍ය විද්‍යාවල යන්ත්‍ර, මන්ත්‍ර, ජ්‍යොතීර් ශාස්ත්‍රය, නිදන් වදුල්, ලිපි, රාජ්‍ය පාලනය, යුද්ධමය කටයුතු හා ඔත්තු සේවය පිළිබඳ ලේඛන සහ නිශ්චල හා චංචල දේපල පිළිබඳ ලේඛන යනාදී විෂයයන් යටතටය. මෙම විෂයයන් සමාජයේ වැදගත් ක්ෂේත්‍රයන්ට අයත් වන බැවින් එකී ක්ෂේත්‍රවලට අදාළ පුද්ගලයන්ට පමණක් ඒවා සීමා කිරීම සඳහා මෙවැනි උපක්‍රම යොදන්නට ඇත. වදුල්, සීට්ටු, ඔප්පු, සන්නස්, තුඩපත්, පණිවිඩ, පැවරුම්, යනාදි සමහර ලේඛනවලින් ඒ බව පෙනේ. නොදැන කරන වෙදකම හෝ යන්ත්‍ර මන්ත්‍රවලින් එසේ කරන්නාටත්, සමාජයටත් අනර්ථයක් මිස සෙතක් සිදු නොවේ. නිදන් වදුල් හෝ දේපළ පිළිබඳ ලේඛන සොරුන්ට අසු වූ විට, ජීවිත හානි කිරීමත්, වටිනා පුරාවස්තු විනාශ කිරීමත්ල දේපොල මංකොල්ල කෑමත් සිදුවේ. එබැවින් පුද්ගලයනුත්, සමාජයත්, දේපලත්, ආරක්ෂා කිරීමේ උදාර පරමාර්ථය මත මෙවැනි ශාස්ත්‍ර රහස් භාෂාවලින් ලියන්නට ඇත. මේ නිසාම පැරැණ්නෝ මෙවැනි ගුප්ත විද්‍යාත්මක ශාස්ත්‍ර සිය ශිෂ්‍යයන්ට හා දූ දරුවන්ට පවා නොදී ගුරුමුෂ්ටියක් ලෙස ආරක්ෂා කළහ. යම් අත්‍යාවශ්‍ය දෙයක් පවා දෙන ලද්දේ එය ලබාගන්නාගේ පැවැත්ම පිළිබඳව සෑහීමකට පත්වී මෙන් හා ඔහුගෙන් නොයෙකුත් පොරොන්දු ලබා ගැනීමෙන් අනතුරුව ය. සිය වටිනා ශාස්ත්‍රය නුසුදුස්සෙකුට දීමෙන් සමාජයට වන අනර්ථයට වඩා එය තමා සමග වැළලීයාම මැනැවයි ඔවුන් සිතන්නට ඇත.

පුස්කොළ පොත් මෙන් ම වෙනත් තල්පත් ලේඛණ ද පුරාණයේ සිට රහස් භාෂාවලින් ලියා ඇති බව පැහැදිලිය. කැලණිතිස්ස රජුගේ බිසවට උත්තිය කුමරා රහස් ලිපියක් යැවීමේ පුවතක් මහාවංසයේ (මව;198) විස්තර වෙයි. මෙම රහස් ලිපිය ගුප්ත භාෂාවකින් ලියූවක්ද යන්න සැක සහිත ය. සිංහල වෙද පුස්කොළ පොතක මිනිස් සිරුරේ භංගාස්ථි සන්ධි කිරීමේ ප්‍රතිකාර ක්‍රමය හා ඖෂධ රහස් භාෂාවකින් සදහන් වන්නේ මෙසේය (ශ්‍රීල1952:10).

විල් නොබු ලවඩ නොබුල රවලැඩ ලාක නොබු
යදුක් ලසග යාගං ගෙහ දේය නොබු
නොක් හැපි ගයා නබ්බුහ රහ දැහ මුබු
වප්හි ලසප හෙප ඉහුරග ලූයඩ යබු

එහි සිංහල අර්ථය මෙසේය.

හික් පොතුල කහට පොතු සහ කැට කැල පොතු
මගුල් කරඳල මාදං දෙවගේම පොතු
පොල් පැණි දමා පත්තුව සිඳ ගැව යුතු
හන්දි කරන වෙන අවුසද කුමට මතු

(Gunawardana;1917:107)

සිංහල පුස්කොළ මන්ත්‍ර පොතක එක් මන්ත්‍රයක් නිවැරදිව ලියා එයින් ලබාගත හැකි ප්‍රයෝජන රහස් භාෂාවකින් දක්වන්නේ මෙලෙසෙනි.

"ඕං නීළ කිඩවිෂ භක්‍ෂ නේස්වාහඃ"

"කුකබ් යබූඩ රිසිදි ලැහුබඩ ගෙපූ"

(බුලත්වලට මතුරා සිරීහී කැවුනට දෙනු) (පේරාදෙණිය වි.පු.පො.එ.)

මෙලෙස විවිධ ක්ෂේත්‍රවලට අයත් පුස්කොළ පොත් හා වෙනත් ලේඛන ප්‍රමාණයක් ගුප්ත හා රහස් භාෂාවලින් ලියා ඇති බවට සාධක

තිබේ. මෙහි වැදගත්ම විශේෂත්වය වන්නේ පුස්කොළ පොත් රහස් භාෂාවලින් රචනා කිරීම නොව එම රහස් භාෂාවන් හා එම භාෂාවන් සකස් කරගන්නා ආකාරය ද ඉදිරිපත් කර තිබෙන්නේ තවත් ගුප්ත භාෂාවකින් වීමය. එහෙයින් රහස් භාෂාවලින් රචිත පුස්කොළ පොත් පරිශීලනය කිරීමට මෙන්ම එම රහස් භාෂාවන් දැනගැනීමට හා හැදෑරීම පිණිස එකී රහස් භාෂා විස්තර කර ඇති රහස් භාෂා ද හැදෑරිය යුතුව තිබේ.

පැරණි පුස්කොළ පොත් ලියා තිබෙන එක් රහස් භාෂාවක් "තල්පත් භාෂාව" නමින් හැඳින්වේ (ශ්‍රීල;71). එම භාෂාවට අයත් අක්ෂර සහ වචන මගින් එම භාෂාව සකස් කරගන්නා ආකාරය තවත් රහස් භාෂා ක්‍රමයකින් ඉදිරිපත් කර තිබෙන්නේ පහත සඳහන් ආකාරයටය.

1. සිව්දිග කොන් අටකී ත්‍රිසූලත් සතෙකී
සොඳුරු මුහුද දකිනාවුන් නෙත් දෙකකී
ශුශ්‍රැයකි කඳ මැද එකකුත් පසෙකී
මෙම ලියුමෙන් ගැණ තෝරා එවන් සකී

මෙම කවියේ ව්‍යාංග්‍යාර්ථය ධ්වනිථාර්ථයට සම්පූර්ණයෙන් වෙනස් වන අතර එම කවියම තවත් තැනෙක සුළු වෙනස්කම් කිහිපයක් සමග මෙසේ සඳහන් වෙයි.

2. සිවු දිග කොන් අටකී ත්‍රීසූලයන් තුනකී
මුදු සයකි ඊපිට යන නැව් දෙකකී
පත්‍ර සයකී අතුපසගිය එක කඳකී
මේ සන්නේ නොවරදවා කියන් සකී

(ශ්‍රී;ල;73)

මෙම කවි දෙකෙහි අර්ථය පැහැදිලි කර තිබෙන්නේ ද එවැනිම සුළු වෙනස්කම් සහිත කවි දෙකකිනි.

1. සත පස තුන එක අට සය   යයියයන
   සිව් දෙකකින් ගැන ලිය අකුරු   අටකින
   කිව් ගණනින් නොවරදවා   එකිනෙකින
   රහස් කරන තල්පත ලිය මෙම   ලෙසින

2. සිව් අට තුන හත දෙක හය නියම   දැන
   පසලඟ එකක් ගැන ගෙන අකුරු   අටකින
   මළ පොත පතේ මන්තර අනුපාන   දැන
   රහස් කරන තල්පත ලියනු මෙම   ලෙසින

(එම)

මෙලෙස නිවැරදි සැබෑ වක්‍යයක අක්ෂර අට බැගින් වෙන් කරගෙන සකසා ගන්නා ගුප්ත භාෂාව වන්නේ "තලපත් භාෂාව" ලෙස මෙම කවියෙන් කියැවෙයි. මෙහි 1 සිට 8 දක්වා අංක සඳහන් වන්නේ අනුපිළිවෙලින් නොවන අතර නියම වාක්‍යයක අක්ෂර අටෙන් අට වෙන් කර නැවත මෙ පද්‍යයෙහි විස්තර වන අන්දමට එම අකුරු ගැලපු විට විකෘති වාක්‍යයක් සැදෙයි. මේ අනුව දීර්ඝව ලියා තිබෙන මන්ත්‍රයක හෝ වෙනත් ගුප්ත විද්‍යාත්මක ලේඛනයක පළමුවෙන්ම අක්ෂර අට බැගින් වෙන්කර ගත යුතුය. අනතුරුව අනු පිළිවෙලින් 4ල 8ල 3ල 7ල 2ල 6ල 5 හා 1 යන ක්‍රමයට එහි ඇති විකෘතිත්වය ඇති වෙයි. එලෙස සකස් කරගත් තල්පත් භාෂාවෙන් රචිත වගන්තියක් මෙසේය.

"හිජුවුමුම්නා රළායික් හගේ සියසර තෙඋහි තාලේණු මිමාමු මල්හි වරුවා ගිම ලේත්ට සොත ක්‍යරු මරුහො පණ ශ්‍රයුග වාකුක මෙ අල යෙවුටය හෙන එන සිමැනි පතයි සාතල"

(මුලාවු රජු නාහිමිගේ රහසක් යැයි සිතා මාහිමි උණු තෙලෙහි ගිල්වා මරු මුවට පත්කළේ තම සොයුරු ශ්‍රමණ ප්‍රතිරූපකයකු ලවා අග මෙහෙසියට එවුන තල්පත් නිසාමැයි).

මෙසේ පුස්කොළ පොත් රචිත රහස් භාෂා සකස් කර ගන්නා ආකාරය පෙන්වා දෙන රහස් භාෂා හඳුනා ගැනීම දීඝී ලෙස විස්තර කළ යුතු අපහසු කාර්යයකි. එහෙයින් එවැනි භාෂාවලින් විස්තර වන තවත් පුස්කොළ පොත් රහස් බස් කිහිපයක් පමණක් සරල සුගම භාෂාවෙන් විස්තර කිරීම ප්‍රයෝජනවත් වේ.

"අක්ෂර මුද්‍රා භාෂාව" එවැනි ඉතා පහසු රහස් තල්පත් රචිත භාෂාවකි (ධම්මපදට්ඨ කථා). ඉතා ප්‍රකට වචනවල මුලකුරු පමණක් දැක්වීම මෙහි ලක්ෂණය වන අතර වර්තමාන භාෂාවල ද මෙම ක්‍රමය ව්‍යාවහර වෙයි. මෙය වගන්ති කෙටිකර දැක්වීමක් ලෙස ද සැලැකිය හැකිය. ලේඛනයට මෙන්ම කථනයට ද පැරණි යුගයේ සිට මෙම රහස් බස භාවිත කර තිබෙන බව සාහිත්‍යගත කරුණු විමසීමේදී පැහැදිලි වෙයි. බුදුන් දවස බිම්සර රජුගේ ඥාති ප්‍රේත සිව්දෙනෙක් "දු. ස. න. සො" යන අක්ෂර එක බැගින් පැවසූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි. රාත්‍රි තද නින්දේ පසු වූ රජුට එම ශබ්දය ඇසුනේ සිහිනෙනි. එයින් පැවැසෙන්නේ ගාථා සතරක මුල් සතරපදයේ මුල් අකුරු සතර බව බුදුන් වදාළහ (එම).

එනම් ''දුජ්ජිවිතං අජිවිම්හ .... සට්ඨිං වස්සසහස්සානි .... නත්ථි අන්තෝ කුතො අන්තො .... සොහි නූන ඉතොගන්ත්වා .... " යන වචනය.

එම ගාථාවලින් විස්තර වන්නේ එම ප්‍රේතයන් නරකයෙහි වසර දහස් ගණන් දුක් විඳිමින් සිටින ආකාරය හා තමන්ට පිං පමුණුවා තමන් එයින් මුදවාගන්වා ලෙස රජුට කළ ආයාචනයත් ය. මෙසේ බුද්ධ කාලයේ සිට පැවැත එන මෙම අක්ෂර භාෂාව පැරණි කාලයේ සිට පුස්කොළ පොත්වලට ද ආවේණික වූවකි.

ජ්‍යොතීර් ශාස්ත්‍ර පුස්කොළ පොතක ඊට අදාළ කරුණු පහත සඳහන් ශ්ලෝකයෙන් හකුලා දැක්වේ.

"මේ වෘෂික සිංකතු වෘ ධ ම කුං මී

මූධ සබසුශක නිධක ආ ව්‍යාඃ

එා වෛ වෛ ජෝ‍ය ආ ශ්‍රා

හා ආ කාමා පෞ මා වෛ ච"

(නැකත් පොත, හිඳගල, ර.වි.)

බැලූ බැල්මට මෙය අර්ථ විරහිත ප්‍රහේලිකාවක් මෙන් පෙනෙන නමුත් මෙහි ප්‍රථම පාදයෙන් "මේෂල වෘෂභල මිථුනල කටකල සිංහල කන්‍යල තුලාල වෘශ්චිකල ධනුල මකරල කුම්භල හා මීන" යන රාශි දොළස දක්වා ඇත. දෙවන පෙළින් "මූණිතිල ධනල සහජල බන්ධුල සුතල ශත්‍රැල කලත්‍රැල නිධනල ධර්‍මල කර්‍මල ආයල සහ ව්‍යාය" යන භාව දෙළස අදහස් වෙයි. තෙවන හා සිවුවන පාද දෙකෙන් " එාලගුණල වෛත්‍රල වෛශාඛල ජෝෂ්ඨල ආෂාඪල ශ්‍රාවණල භාද්‍රපදල ආශ්වීනීල කාර්තතිකල මාගසිරල පෞෂ සහ මාඝ" යන දෙළොස් මාසය ප්‍රකාශිතය.

"අක්ෂර භාෂාව" ද වැදගත් රහස් පුස්කොළ පොත් රචිත භාෂාවකි. මෙහි ප්‍රධාන ලක්ෂණය නම් ව්‍යඤ්ජනාක්ෂරවලට ස්වර ආරූඪ නොකර වචනවල ගත'කුරු හා පණ'කුරු වෙන වෙනම තැබීමය. අක්ෂරවල කොම්බුවල ඉස්පිල්ලල පාපිල්ලල හලාන්තාක්ෂර හෝ සංයෝගාක්ෂර ද නැත. ඒ වෙනුවට ස්වරාක්ෂර භාවිත වෙයි. හල් ලකුණ වෙනුවට '෴. අකුර යෙදේ. එය පසුකාලීනව එකතු වූවකි. මෙම රහස් භාෂාවේ සූත්‍රය මෙසේ විස්තර වෙයි.

"අයනු ඇලපිල්ල ඉස්පිල්ලට ඉයනු
එයනු කොම්බුවට පාපිල්ලට උයනු
ඍයනු ඇඳට අල්ලකුණට ද යනු
ලියනු මෙලෙස "අක්ෂර බස " යයි කියනු"

"තමා වරද නොදිස්නේ - මෙරමා දොස්ම දිස්නේ
ඤුවන් බැහැර නහමත් - තමාමුත් නොදක්නේ කිම්"

(ශ්‍රී;ල;74)

මෙම ගීය අක්ෂර භාෂාවට නැගූ පසු පහත සඳහන් ලෙස විය යුතුය.

"තමඅ වරද නමද ඉස නළු - මළු රමඅ දඹස මදඉස නළු

නළවන බසඃ හසඃ නහමත - තමඅ මළතෆ නඹදකෆ නළුකඉමෆ"

"පූනරක්ෂර භාෂාව" තවත් රහස් භාෂාවකි (වීදාගම,දෙ.සි,1985,8). මෙම භාෂාවට අයත් හෝඩියේ අක්ෂර එකිනෙකට අන්‍යොන්‍ය වශයෙන් අරෝපණය කර ලිවීම මෙහි රීතිය වන අතර අක්ෂර විපර්යාසයක් සිදු නොවේ. පුනරක්ෂර භාෂාවේ සූත්‍රය ගාථාවක් ලෙස දැක්වෙන්නේ මෙලෙසිනි.

"අ - ඕල ක - දාල ග - තා, ඤැ- ණ

ඉ-උෟල ච - ඣල ජ - ටාල ප-බා

ඒ - ආල න - රාල ස - යාල වා-ම

ශා - ලාල හ - ලල පුනස්සරං"

මෙම සූත්‍රයට අනුව 'අ. යන්නට 'ඕ. යන්නද 'ඕ. යන්නට 'අ. යන්නද 'ආ. යන්නට 'ඒ' යන්නද 'ඒ' යන්නට 'ආ. යන්නද නැවත නැවත භාවිත වෙයි. සෙසු අකුරුද මෙම පිළිවෙලානුසාරයෙනි.

"පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්කොළ පොත් සංගමයක් තිබේ"

යන වගන්තිය පුනරක්ෂර භාෂාවෙන් ඉදිරිපත් කළ පසු මෙලෙස දිස්වේ.

"බේනාකෙඣිසා මිල්මා මිකාහසේ බූය්දොහ බෝග් යංතාවාසාද්ගිපේ"

"උකඳ භාෂාව" ද රහස් භාෂාවක් ලෙස ප්‍රචලිත වූවකි (හිලරිස්,දොන්.ඇම්,1956,37). පූනරක්ෂර භාෂාව මෙන් මෙයද සූත්‍රයේ

සඳහන් අක්ෂර එකිනෙකට මාරු කර භාවිත කරන්නකි. උඤ්ද භාෂාවේ හෝඩියට අක්ෂර යුගල දෙළසක් ඇති අතර 12 වෙනි අක්ෂර යුගලය "උ - ඤ්ද" යන අක්ෂරයන් බැවින් මෙම බස ද එනමින්ම ව්‍යවහාර වෙයි. එහි සූත්‍රය මෙසේය.

අ - ඉ	ය - ම	ත - බ
ස - ර	ද - ග	එ - ඔ
ව - හ	ච - ජ	ඒ - න
ල - ක	ට - ඩ	උ - ඤ්ද

සූත්‍රය අනුව 'අ' යන්නට 'ඉ' යන්න දල 'ඉ' යන්නට 'අ' යන්න ද ආරූඪ කළ යුතුය. ඉස්පිලි පාපිලිල කොම්බුව හා හල් ලකුණු අදාළ අක්ෂරයට ම ආරෝපණය කළ යුතුය.

"අපේ පැරණි අත් ලිපි අප විසින් රැක ගතයුතු අගනා වස්තුවකි." යන වගන්තිය උඤ්ද භාෂාවට අනුව ගුප්ත ක්‍රමයට සකස් කළ විට පහත සඳහන් පරිදි විය යුතුය.

"ඉනේ නැසැපි ඉබ්කිනි ඉනහිරිප් සැලැදමුබූ වදපා හර්බූ හලි"

"අංක භාෂාව " නමින් සිංහල හෝඩියේ අක්ෂර සූත්‍රයක් අනුව සකසා එම අක්ෂර වලට අංක (ඉලක්කම්) ආරූඪ කර ගොඩනගා ගන්නා ලද රහස් භාෂාවක් ද පුස්කොළ පොත් ගුප්ත ක්‍රමයට රචනා කිරීම සඳහා භාවිත කර තිබේ (එම). මෙහි තිබෙන විශේෂ ලක්ෂණය නම් අදල අංක වලටම ඉස්පිලිල පාපිලිල හල් ලකුණුල කොම්බුව යනාදී සංකේත යෙදීම බව පෙනේ. අඩික භාෂාවේ සූත්‍ර නියමය අනූව අක්ෂර 25ක් භාවිත වෙයි.

අ - 1	ක - 6	ඩ - 11	බ - 16	ව - 21
ඉ - 2	ග - 7	ත - 12	ම - 17	ස - 22
උ - 3	ච - 8	ද - 13	ය - 18	හ - 23
එ - 4	ජ - 9	න - 14	ර - 19	අං - 25

ඔ - 5 ට - 10 ප - 15 ල - 20 ළ - 24

"අභාවයට ගොස් ඇති ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව පුනරුත්ථාපනය කිරීමට දිරිදෙමු" යන්න අඩික රහස් භාෂාවෙන් ලියූ පසු මෙසේය.

"1 16ා 21 18 10 f7ා 22් 1ැ 12ී 20

25 6ා ෙ21ි 15ු 22් ෙ6ා 24 ෙ15ා 12්

ෙ20් 6 14 620ා 21 15ු 14 19ැ 12් 12ා

15 14 18 6ි 19ී 17 10 13ි 19ී ෙ13 17 "

"අකිස් භාෂාව " දීර්ඝ වගන්ති සහිත රහස් භාෂාවක් ලෙස හැඳින්විය හැකිය (වීදාගම,1985,8). මෙම ගුප්ත භාෂාවේ වාක්‍යාංශ දිගු වීමට හේතු වූයේ එහි හෝඩියට අයත් සෑම අක්ෂරයකටම අක්ෂර 2 සිට 5 දක්වා අක්ෂර ප්‍රමාණයක් අඩංගු වචනය බැගින් ආරෝපණය වීම නිසාය. කොම්බුවල ඉස්පිල්ලල ඇලපිල්ලල පාපිල්ල හා හල් ලකුණට ද එවැනි වචනය බැගින් ඇත. අක්ෂරයක් සඳහා වචනයක් භාවිත වන මුල්ම වචනය "අකිස්" යන්න නිසා මෙම භාෂාව ද එනමින් ප්‍රකටව ඇත. මෙහි සූත්‍රය පහත සඳහන් වෙයි.

අ	-	අකිස්	ක	-	කුවැයිස්	ත	-	තාකුරු
ඉ	-	ඉස්කි	ග	-	ගද්‍ර	ද	-	ද්‍රවයිස්
උ	-	උබ්‍රි	ජ	-	ජංකි	න	-	නාද
එ	-	එන්ද	ට	-	ටංකි	ප	-	ප්‍රදේස
ඔ	-	ඔ	ඩ	-	ඩංකි	බ	-	බ්‍රංගු
						ම	-	මයිස්

* සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාර කෞතුකාගාරයේ තැන්පත් කර තිබෙන අදාළ ජාතක කථා පොත් වහන්සේගේ අවසන් පත්ඉරුවෙනි.

ය	යයිස්	ෙ	දිස්කෝස්තු
ර	රයිස්	ා	අක්‍රුදා
ල	ලයීස්	්	දේ‍රංසු
ව	ව්‍රංග	ු	කුපු
ස	සයිස්	ි	ඉස්කි
හා	හාදුරු	ං	දේ‍රාංසු

"ක්‍රි. ව. දහතුන් වන සියවසේ සිට රචිත අගනා පුස්කොළ පොත් අප ජාතිය සතුව තිබේ." යන වගන්තිය අකිස් බසින් මෙසේය.

"ක්‍රුවැයිස් ඉස්කිල ව්‍රංගු. ද්‍රවයිස් හාදුරු - තාකුරු කුපු නාද දේ‍රංසු

ව්‍රංගු නාද සයිස් ඉස්කි යයිස් ව්‍රංගු - සයිස්දිස්කොස්තු දේ‍රංසු

සයිස්ඉස්කි ටංකි රයිස් වංකි ඉස්කි තාකුරු - අකිස් ගද්‍ර නාද

අක්‍රුදා ප්‍රදේස් දිස්කොස්තු අක්‍රුදා තාකුරු දේ‍රංසු අකිස් ප්‍රදේස්

ජංකි අක්‍රුදා තාකුරු ඉස්කි යයිස් තාකුරු කුපූ ව්‍රංගු තාකුරු

ඉස්කි බ්‍රංගුදිස්කොස්තු දේ‍රංසු"

"සකාර භාෂාව" පුස්කොළ පොත් රචනා කර ඇති රහස් භාෂා අතරින් පහසුම භාෂාව ලෙස සැලකිය හැකිය (ශ්‍රී.ල,1952,73). මෙහි හෝඩිය සඳහා වෙනම සූත්‍රයක් නොමැත. වචනයක සෑම මුළ අකුරක් පාසාම එම අක්ෂරයට මුළින් 'ස' කාරයක් යෙදීම මෙහි රීතිය වන අතර එහෙයින්ම මෙම ගුප්ත භාෂාව ද සකාර භාෂාව නමින් හැඳින්වෙයි. ඒ අනුව පහත දැක්වෙන වගන්තිය සකාර භාෂාවට පරිවර්තනය කළ හැක.

(අපට අයිති විය යුතු ශ්‍රී ලංකාවේ ඉතා වටිනා පැරණි පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් විදේශීය කෞතුකාගාරවල සහ පුස්තකාලවල ඇත.)

"සඅසපසට සඅසයිසතිසවිසය සයු සතු සලසංසකාසවේ

සඉසතා සවසටිසනාසපැසරුසණි සපුසස්සකොසළ සපොසත්

සවිසශාසල සප්‍රසමාසණසසයසක් සවිසදේසශීසය

සකෞසතුසකාසගාසරසවසල සසසහ සපුසස්සතසකාසලසවසල සඇසත."

"අම්භ භාෂාව" ද ලක්දිව පැරණි රහස් භාෂාවකි (එම). මෙය ද අකිස් භාෂාව මෙන් දීර්ඝ රහස් භාෂාවකි. මෙහිද 'අ' කාරයේ සිට සෑම අක්ෂරයකටම අක්ෂර 2 සිට 6 දක්වා ප්‍රමාණයක් අඩංගු වචනය බැගින් අයත් වේ. මෙම හෝඩියේ මුල්ම අක්ෂරයේ මුල්ම වචනය "අමෙහ" යන්නය. එබැවින් මෙ භාෂාව ද එනමින් වැහැරේ. සෑම අකුරකටම අයත් වචනය ද අකිස් භාෂාවේ මෙන් ආරම්භ වන්නේ එම අක්ෂරයෙන්මය. එහෙත් මෙහි ඇති විශේෂත්වය සෑම වචනයක්ම පාලි වචන වීමය. මාගධී වචනවලට වෙනම සිංහල අර්ථයක් ඇත. එහෙත් එම අර්ථය නොව වචනයෙන් ගම්‍ය වන අක්ෂරය පමණක් අම්භ භාෂාවේදී සැලකිල්ලට ගනු ලැබේ. වඩාත් පහසුවනු පිණිස පාලි වචනවල සිංහල අර්ථය ද සමග අම්භ භාෂාවේ සූත්‍රය මෙසේ දැක්විය හැකිය.

අ	-	අමෙහ	=	අප/ගේ/ට	ජ	-	ජම්බීරං	=	ගැඹුරු
ඉ	-	ඉමස්මිං	=	මෙම	ට	-	ටංක	=	ටැඹ
උ	-	උච්චා	=	උස	ඩ	-	ඩස්සති	=	දෂ්ඨකරයි
එ	-	එසො	=	ඔහු/එය	ත	-	තථා	=	එසේ
ඔ	-	ඔජො	=	ඔද	ද	-	දස්සනං	=	දැකීම
ක	-	කරොති	=	කරයි	න	-	නත්ථි	=	නැත

ග -	ගන්තවා =	ගොස්	ප -	පඨමං =	පළමුවෙනි
ච -	චත්තාලිස =	සතලිස	බ -	බන්‍ධු =	නෑයා
ම -	මය්හං =	මගේ	⌒ -	ඉතිබො =	මෙසෙ වනාහි
ය -	යස්මිං =	යමකින්	ෟ -	උභො =	උභය
ර -	රජ්ජං =	රාජ්‍යය	ෘ -	අයමපිව =	මෙයද
ල -	ලබෙ =	ලබයි	) -	යථා =	යම්සේ
ව -	වන්තු =	වේවා	ෙ -	එවං =	මෙසේ
ස -	සත්‍ථා =	ශාස්ත්‍ර	ᵖ -	අගෙගා =	අග්‍ර
හ -	හනත්‍වා =	නසා	ෟ -	දීඝං =	දිග

අම්හ භාෂාවෙන් රචිත වාක්‍යාංශයක් හා එහි සිංහල අර්ථය පහත දැක්වේ."බන්‍ධු උභො දස්සනං උභො වන්තු සත්‍ථා ඉතිබො යස්මිං පඨමං සත්‍ථා අගෙගා පඨමං නත්‍ථි සත්‍ථා අගෙගා වන්‍තු අයම්පිච නත්‍ථි අශෙහා එවමං නත්‍ථි හන්ත්‍වා ඉතිබො අගෙගා මය්හං යථා තථා ලභෙ එවං අගෙගා අමෙහ ලභෙ උභො වන්තු ඉතිබො හන්ත්‍වා යථා රජ්ජං එවං යසමිං අගෙගා දසසනං ඉතිබො බන්‍ධු උභො දසසනං උභො දසසනං හන්ත්‍වා මයිහං පඨමං උභො සත්‍ථා අගෙගා එවං කරොති යථා ලභෙ අගෙගා එවං පඨමං යථා තථා අගෙගා වන්‍තු ලභෙ ඉතිබො වන්‍තු ඉතිබො අගෙගා යස්මිං"

(බුදු වසින් සිව්සිය පස්පණස් වැන්නෙහි මාතලේ අළුවිහාරයේ දී බුදු දහම පුස්කොළ පොත්වල ලිවීය)

මෙම රහස් භාෂා හෝඩි අධ්‍යයනය කරන විට පැහැදිලි වන පොදු කරුණක් වන්නේ සෑම හෝඩියකම පාහේ මහාප්‍රාණ අක්‍ෂර හා සඤ්ඤක අක්‍ෂර හිඟවීමත් අක්‍ෂර ප්‍රමාණය ඉතා සීමිත වීමත් ය. බොහෝ විට භාවිත වී තිබෙන්නේ ශුද්ධ සිංහල හෝඩියේ අක්‍ෂර පමණි (පෙරේරා;78). මිශ්‍ර සිංහල හෝඩියේ අක්‍ෂර භාවිත වී නැති නිසාම මෙම භාෂාවල පැරණි බව ද පැහැදිලි වෙයි. මුල්ම ප්‍රාකෘත

සිංහල හෝඩියේ මහාප්‍රාණාක්ෂර, සංයුක්තාක්ෂර, සඤ්ඤකාක්ෂර හා හල් අක්ෂර භාවිත දුලබ ය. විශේෂයෙන්ම මෙරට භාවිත වූ මුල්ම අක්ෂර හෝඩිය (Fernando;1949:58-62) වූ බ්‍රාහ්මී අක්ෂර හෝඩියට අයත් අක්ෂර ශුද්ධ සිංහල හෝඩිය ඔස්සේ මෙම රහස් භාෂා හෝඩිවලට පැමිණ ඇති හෙයින් බ්‍රාහ්මී අක්ෂර හෝඩිය සමග ද රහස් භාෂා හෝඩිය සම්බන්ධ වන බව පෙනේ. ශුද්ධ සිංහල හෝඩිය සකස් වූයේ ක්‍රි.පූ. 3 සියවසේ භාවිත වූ බ්‍රාහ්මී අක්ෂර හෝඩිය අනුව ය. එහි ද මහාප්‍රාණාක්ෂර, දීර්ඝාක්ෂර, සඤ්ඤකාක්ෂර නොවීය. එබැවින් සෙල්ලිපි හා පුස්කොළ පොත් ලේඛන කලාව අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධයක් තිබේ.

සමහර සෙල් ලිපිවල ද පුස්කොළ පොත්වල ඇති රහස් භාෂාත්මක වචන හා සංකේතාදිය තිබෙන බව පෙනේ. සෙල්ලිපිවල හා පුස්කොළ පොත්වල "සිද්ධම්" යන ආශිර්වාදත්මක වචනයෙන් ලේඛනය ආරම්භ වීම නිදසුනක් ලෙස දැක්වීමට හැකි ය. සමහර පුස්කොළ පොත්වල (Fernando;1985:182) හා සමහර සෙල්ලිපි වල ද (Paranavitana;1956:56,10,12) මෙම වචනය කෙටිකර "සී" (තෝනිගල ශි. ලේ) "සිධ" (විහාරෙගල ශි. ලේ) යනුවෙන් සඳහන් වෙයි. "ස්වස්ති" 'ශුභමස්තු' යනාදී වචන ද එසේ භාවිත වෙයි. මෙම ක්‍රමය "අක්ෂර මුද්‍රා භාෂාව" නැමැති රහස් භාෂාවට අනුකූලය. එමෙන්ම ධර්මචක්‍රය, ස්වස්තිකය, ඉර, හඳ වැනි සංකේත පුස්කොළ පොත්වල සේම සෙල්ලිපිවල ද තිබේ (අමරවංශහිමි;1969:72,44). එය "ලාක්ෂණික භාෂාව" නම් ගුප්ත භාෂාවට අයත් ක්‍රමය යි (ලගමුව,1992,15). මේ අනුව අක්ෂර, භාෂාව, ලේඛන ශෛලීය හා ඇතුළත් විස්තර යන කරුණුවලින් සැහෙන පමණ සමානත්වයක් ශිලා ලේඛන හා පුස්කොළ පොත් අතර තිබෙන බව පැරණි ලිඛිත රහස් භාෂා පිළිබඳව විමසන විට පැහැදිලි වෙයි (Paranavitana;1983:64,82). මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ලංකාවේ පැරණි ලේඛන රචිත රහස් භාෂාවන් විමසා බැලීම පමණි.

නිගමනය

ඉහත සාකච්ඡාවට භාජනය වූ දත්ත හා සාක්ෂ්‍ය සාධක අනුව පුරාණ ශ්‍රී ලංකාවේ ප්‍රාකෘත සිංහල භාෂාව ආරම්භ වූ වකවානුවේ

සිට ප්‍රාග් නූතන යුගය දක්වාම විශේෂිත වූ විෂයය ක්ෂේත්‍රවල ප්‍රායෝගික භාෂා ව්‍යවහාරයේ දී රහස්‍ය භාවය සුරක්ෂිත කරගනු පිණිස විවිධ රහස් භාෂාවන් භාවිත කළ බව පැහැදිලි වේ. සිංහල, සංස්කෘත හා පාලි භාෂාවන් සහ අක්ෂර මෙන්ම අංක (ඉලක්කම්) මගින් රහස් භාෂාවල සූත්‍ර විවිධ සමාජ කණ්ඩායම් විසින් නිර්මාණය කරගෙන තිබෙන බව අවබෝධ විය. එවැනි භාෂා උගත් හෝ එකී සම විෂයය ක්ෂේත්‍රවල පුද්ගලයන්ට පමණක් එවැනි භාෂා දැනුම පැවැති බවත් තහවුරු වේ. රහස් භාෂා තුළින් එවැනි සීමා මායිම් පැවතීම මඟින් විශේෂ ප්‍රයෝජන ලබා ගැනීමටත් එම විෂයය ක්ෂේත්‍රයයන්වල මෙන් සමාජ සුරක්ෂිත භාවය තහවුරු කිරීමටත් එමගින් හැකි වූ බව තීරණය කළ හැකිය. මෙම ගූඪ භාෂාවන් අධ්‍යයනය මගින් රහස් ලේඛනවල ඥාන සම්භාරය ඒ ඒ විෂයය ක්ෂේත්‍ර ඔස්සේ රටේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා වර්තමානයට මෙන්ම අනාගතයට ද ප්‍රයෝජන ගත හැකි බව පෙන්වා දීමට පුළුවන.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ හිමි, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි*, 1960 කොළඹ.

උත්තරානන්ද හිමි, ඉඳුරුවේ, "රාවණ සහ විභීෂණ", ග්‍රන්ථ ප්‍රකාශය 1956 කොළඹ.

ගුණවර්ධන, දයානන්ද, මධුර ජවනිකා හෙවත් සිංගල වංශය, 1984 (වි.මු) කොළඹ.

ධම්ප්‍රදීපිකාව, බද්දේගම විමලවංශ හිමි සංස්. 1959 (ගු. මු) කොළඹ.

පෙරේරා, තියොඩෝර්. ජී හිමි, සිංහල භාෂාව, 1935, කොළඹ.

මහාවංසය, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා එස්. බී. බටුවන්තුඩාව, සංස් 1912, කොළඹ.

මහින්දසිරි, පියදාස, "ලංකාවේ ආයුර්වේද ලේඛනාවලිය", සංස්කෘති 7 ක

සං, සංස්, අමරදාස වීරසිංහ හා රෙජී රණසිංහ, 1959, කොළඹ.

මුනිදාස, කුමාරතුංග, ව්‍යාකරණ විවරණය, 1983 (නැ.මු.) කොළඹ

රසවාහිනී... රසවංශය, හේන්පිටගෙදර ඥානසීහ හිමි. සංස් 1961 (ස.මු) මහරගම.

රාජාවලිය, බී. ගුණසේකර සංස්. 1926 (රා. මු. දෙ) කොළඹ.

ලගමුව, ආරිය, "ලේඛන කලාවේ ප්‍රභවය", පුස්තකාල ප්‍රවෘත්ති, 13, 4, 1992 (ශ්‍රී.ල.ජා.පු.) කොළඹ.

ලගමුව, ආරිය, ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව, (2006) නැ.මු. 2016 (සරසවි ප්‍ර. මු.) නුගේගොඩ.

වීදගම, දෙ, සි. සිංහලයේ පැරණි රහස් ලිපි, සිළුමිණ, 1985 10. 03. (ලේ. හ.) කොළඹ.

සුළුරාජාවලිය, සී. ඩී. එස්. කේ. ජයවර්ධන සංස්. 1914, කොළඹ.

සේනානායක, ගාමිණී, "සිංහල භාෂාවට හා සාහිත්‍යයට නූතන විද්‍යුත් මාධ්‍යයේ බලපෑම" පී. බී. ප්‍රතිභා උවසර, සංස්. රංජිත්

සේනානායක, 2012, (වි. ග්‍ර. කේ.) බොරැල්ල. ශ්‍රී ලංකා 4 කා. 8. ක. 1952 (ල. ප්‍ර. දෙ.) කොළඹ.

හිලරීස්, දොන් ඇම්."විජය කුවේණි සාකච්ඡාව", ග්‍රන්ථ ප්‍රකාශය, 1956, කොළඹ.

Fernando" P.E.E "Palaeographical Development of the Brahmi Script in Ceylon – From 3rd Century BC to 7th Century AD, University of Ceylon Review, Vol. Vll, No. 4, 1949, Colombo.

Fernando, P.E.E. A Note on Three Old Sinhalese Palm- leaf Manuscripts, Sri lanka. Journal of the Humanities, Vol. Vlll, No 182, 1985, Colombo.

Grassmann, Harmann Woturbuch Zumi – Veda, 1, 93, 1972.

Gunawardana, C.W.E. Medicinal Plants of Ceylon and Sinhalese Medicines in English, 1917, Colombo.

Mirando, A.H. Sinhala and Elam, The Island 02.06. 1984 Colombo.

Paranavitana, S. Inscriptions of Ceylon, Early Brahmi Inscriptions, Vol. 1970, Colombo.

Paranavitana, S. Sigiri Graffity, 8-10 Centuries, Vol. 1, (1956) Reprinted 1982, Colombo.

Rasanayagama, Mudliyar,C. Ancient Jaffna, Asian Education Service, 1984,

New Delhi.

Saraswati Kanthabharanam Edited by T.R. Chintamam. University Press, - 1937, Madras.

Schleicher, August Compendium der Verglelchenden Grammatik der

Indogrmanischen, 1861.

Senaviratne, Anuradha Rama and Ravana, History, Legend and Belief in Sri Lanka, Ancient Ceylon. Vol. 5. 1984 Colombo.